IHRA
UNIVERSITY OF COLOMBO

04

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2016/2017

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2018 දෙසැම්බර්)

## BLE 203 - සමාජ ගවේෂණ ක්‍රම

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සමන්විත වේ.

(2) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. පර්යේෂණයක් යනු කුමක්දැයි පැහැදිලි කර විද්‍යාත්මක පර්යේෂණයක මූලික පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. පර්යේෂණ ගැටළුවක් සකස් කර ගැනීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු මොනවාදැයි ඔබ කැමති පර්යේෂණ මාතෘකාවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. උපන්‍යාසයක් (hypothesis) යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කර උපන්‍යාස ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

04. දත්ත රැස්කිරීමේ ප්‍රධාන විධික්‍රම මොනවාදැයි පැහැදිලි කර ඒවා භාවිතා කරන අවස්ථාවන් සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. දත්ත රැස්කිරීමේ විධික්‍රමයක් ලෙස සම්මුඛ සාකච්ඡා විධික්‍රමය කෙටියෙන් පැහැදිලි කර එම විධික්‍රමයේ ඇති වාසි සහ අවාසි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06.

i. ප්‍රශ්න මාලාවක් සකස් කිරීමේ දී සැලකිල්ලට ගතයුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ප්‍රශ්න මාලා ක්‍රමය භාවිතා කිරීමේ වාසි අවාසි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

07.

i. සමාජ පර්යේෂණයකදී නියැදි (Sampling) ක්‍රමය භාවිතා කිරීමේ වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. සසම්භාවී නියැදි ක්‍රමය කෙටියෙන් පැහැදිලි කර සසම්භාවී නියැදි ක්‍රමය යොදා ගන්නා අවස්ථා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

08. පහත සඳහන් මාතෘකා හය (06) අතුරින් ඕනෑම හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ප්‍රාථමික දත්ත සහ ද්විතික දත්ත (Primary data and Secondary data)

ii. ප්‍රමාණාත්මක දත්ත සහ ගුණාත්මක දත්ත (Quantitative data and Qualitative data)

iii. පර්යේෂණ සැලැස්ම (Research Design)

iv. පර්යේෂණ ආචාරධර්ම (Research Ethics)

v. පුද්ගලබද්ධ තාවය සහ විෂය බද්ධතාවය (Subjectivity and Objectivity)

vi. අසම්භාවී නියැදුම් (Non-probability sampling)

(ලකුණු 4x5 - 20)

******************************